**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය වාරිකවල එකතු වටිනාකම වූ රු. 3,444,660 ක් ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ නොදක්වා ජංගම නොවන වගකීම් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වගකීම් නිවැරදිව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දැක්විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතු ප්‍රාග්ධන වියදම් රු. 3,256,933 ක් ගිණුම්ගත කර නොතිබූ අතර රු. 1,083,843 ක් වූ ප්‍රාග්ධන වියදම් පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රාග්ධන වැය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2018 වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අපජලය පිරිපහදු කිරීමේ පද්ධතිය සංවර්ධනය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් රු. 1,427,579 ක ණයහිමි හා ණයගැති ප්‍රතිපාදන වෙන් කර තිබුණත්, ඉදිරි වර්ෂය වෙනුවෙන් එම කර්මාන්තය අවිච්ඡේද නොකරන බවට සඳහන් වූයෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට එම වටිනාකමින්ම ණයගැතියන් සහ ණයහිමියන් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී ණයගැති හා ණයහිමි ලේඛන වලින් ඉවත් කිරීමට කටයුතු කරමි. | ණයගැති හා ණයහිමි වෙන් කිරීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2013 වර්ෂයේදී සභාවේ පෙරටු කාර්යාලය ඉදිකිරීම වෙනුවෙන් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 2,018,000 ක් සඳහා ණයගැති ප්‍රතිපාදන වෙන් කර තිබුණද වැය කළ වියදම රු. 1,724,411 ක් වූයෙන් රු. 293,589 ක් වැඩියෙන් ණයගැති ප්‍රතිපාදන සලසා තිබුණි. | ඉදිරියේදී සභා තීරණයක් ගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. | ණයගැති වෙන් කිරීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී ලද ස්ථාවර තැන්පතු පොලී රු. 127,726 ක් ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී යටතේ ගිණුම්ගත කර තිබුණි. | ස්ථවර තැන්පත් පොළීය අලුත් කිරීමේ නිවේදනය බැංකුවෙන් ලැබුණු පසුව ආදායමට ගනු ලබන බව. | ලද ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ රු.102,342 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.70,892,458 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළව ශේෂයන් හා ඊට අදාළ උපලේඛන/ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.1,023,072 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස නිවැරදි කිරීමට කටයුතු කරමි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.340,041,978 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කරන බව සහ වර්ෂ ගණනාවක සිට පැවත එන ශේෂයන් සඳහා විස්තර සොයාගත නොහැකි බව. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,544,548 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,882,988 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| i. | ලැබිය යුතු වරිපනම් බදු රු.1,181,695 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2007 වර්ෂයේ දේපල තක්සේරුව මත සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් බදු අය කිරීම නිසා තක්සේරුව යාවත්කාලීන නොකර බදු අයකළ කාලය වර්ෂ 08 ක් විය. | කොරෝනා වසංගතය නිසා බදු මුදල් අයකර ගැනීමට නොහැකි වූ බවත් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව සහ වර්ෂය ආරම්භයේදී ලද නව තක්සේරුව අනුමැතිය සඳහා ආණ්ඩුකාරවරයාට ඉදිරිපත් කළ බවත් අනුමැතිය ලද පසු ක්‍රියාත්මක කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමත් දේපල තක්සේරුව කාලීනව ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. | ලැබිය යුතු ව්‍යාපාර හා කර්මාන්ත බදු රු.77,600 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර එම හිඟ ශේෂයෙන් පෙර වර්ෂයන්ට අදාළ ශේෂය රු.81,800 ක් විය. | රු. 31,800 ක් සඳහා නඩු පැවරූ බව සහ ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| **(ආ)** | **කුලී**<br>**----** | | |
| i. | ලැබිය යුතු කඩ කුලී රු.1,064,364 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| ii. | සභාව සතු පොදු වෙළඳපල බදු දීම වෙනුවෙන් ලැබිය යුතු රු.766,091 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | - එම - |
| iii. | සභාව සතු යන්ත්‍රෝපකරණ කුලියට දීම වෙනුවෙන් ලැබිය යුතු කුලි රු.1,143,139 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරිය ඉදිරියේදී අයකර ගැනීමට සහ පොදු කටයුතු වෙනුවෙන් ලැබිය යුතු මුදල් කපා හැරීම සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කළෙමි. | - එම - |
| iv. | පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු) 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/ පපාකො / 2010 / 01 දරන චක්‍රලේඛනයේ 02 ඡේදය පරිදි තාවකාලික තක්සේරුවක් මත කඩ කුලිය අයනොකර කඩ කාමර 23 ක් සඳහා 2007 සහ 2012 වර්ෂයන්වලදී ගනු ලැබූ සභා තීරණ මත කඩ කුලී අයකර තිබුණු අතර 04 ඡේදය පරිදි කඩ කාමර 04 කින් රු.438,000 ක එක්වන් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද 05 ඡේදය පරිදි කඩ කාමර 07 ක ගිවිසුම් වසර 03 කට වරක් යාවත්කාලීන කර නොතිබූ අතර කාල පරාසය වසර 01 ක් හා වසර 16 ත් අතර විය. | කඩ කාමර 23 තක්සේරු කිරීමට කටයුතු තරන බවත්, හිඟ එක්වන් අයකර ගැනීමටත්, ගිවිසුම් යාවත්කාලීන නොකළ කඩ කාමරවල බදුකරුවන්ට අවසාන නිවේදන නිකුත් කළෙමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **උසාවි දඩ හා මුද්දර ගාස්තු**<br>**------------------------------** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.261,514 ක් හා රු.40,191,592 ක් විය. | හිඟ මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙන්වා ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදුලි හා බල ශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය පරිදි නව වීථි ලාම්පු ස්ථාපිත කිරීමේදී විදුලි බල මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත් වීථි පහන් ඒකක 1948 ක් සඳහා එසේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ වීථි පහන් නඩත්තුව වෙනුවෙන් රු.1,874,744 ක් වැයකර ඉන් ප්‍රතිපූර්ණය කරගත හැකි වියදම රු.114,060 ක් වූයෙන් රු.1,760,684 ක් අය කරගත නොහැකි වියදමක් විය. | මහජන සුභසාධනය වෙනුවෙන් වීථි පහන් සවි කළ බවත්, වියදම් ප්‍රතිපූර්ණය කරන මෙන් ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඉල්ලීම් කළෙමි. | වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට සහ නව වීථි ලාම්පු සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් පෙර වර්ෂයන් වලදී නඩු පවරන ලද පුද්ගලයන් තිදෙනෙකුගෙන් ලැබිය යුතු රු.519,632 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණු අතර නඩු පැවරීමට අදාළ විස්තරද සභාව සතුව නොතිබුණි. | මෙම පුද්ගලයින්ට අදාළ තොරතුරු ලබා දෙන මෙන් තංගල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ලිපියක් ඉදිරිපත් කළෙමි. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 වර්ෂයේදී රු.202,400 ක් වැයකර 2018 දෙසැම්බර් 31 දින ආරම්භ කල කොම්පොස්ට් ව්‍යාපෘතියේ අපජලය පිරිපහදු පද්ධතිය සංවර්ධනය කිරීමේ කර්තව්‍යය සඳහා සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගෙන නොතිබුණු අතර එම ඉදි කිරීම සඳහා යොදාගත් කම්බි ප්‍රමිතියෙන් බැහැර වීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි. | ප්‍රමිතියෙන් යුතු කම්බි භාවිතා කර ගිවිසුම්ගත සමිතිය විසින් නැවත ඉදි කිරීම් සිදු නොකළ නිසා එම සමිතිය සඳහා කිසිඳු මුදලක් සභාව මඟින් නොගෙවූ බවත්, ව්‍යාපෘතියට අදාළ ප්‍රතිපාදන අවිච්ඡේද නොකරන බවට සඳහන් වූයෙන් ඉදිරියේදී ණයගැති, ණයහිමි ලේඛන වලින් ඉවත් කරමි. | ගිවිසුම් හා ඇස්තමේන්තුව පරිදි ව්‍යාපෘති ඉටු කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |